# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 30 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 අගෝස්තු මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන් ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය

මිළ : ශත 45 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 30 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 27/82.

**1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 30 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— 1981 අංක 74 දරන පනතේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"විශ්ව විද්‍යාලයේ අනුබද්ධායතන.

6. (අ) ශ්‍රී ලංකාවෙහි හෝ විදේශ රටක යම් උසස් අධ්‍යාපන ආයතනයක් ; හෝ

(ආ) අධ්‍යාපන ආයතනයක් කළමනාකරණය කරන යම් පිරිවෙනක්,

විසින් ඒ උසස් අධ්‍යාපන ආයතනය හෝ අධ්‍යාපන ආයතනය විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයක් වශයෙන් පිළිගෙන ලියාපදිංචි කරන ලෙස පාලක සභාව වෙත ලිඛිතව ඉල්ලුම් කරනු ලැබිය හැකිය. පාලක සභාව විසින් නියෝග මගින් නියම කරනු ලබන යම් කොන්දේසිවලට ඒ ආයතනය අනුකූල වන්නේ නම්, පාලක සභාව විසින් එවැනි යම් ආයතනයක් ලියාපදිංචි කරනු ලැබිය හැකිය :

එසේ වුවද, විද්‍යෝදය හා විද්‍යාලංකාර යන මහ පිරිවෙන් දෙකින් යම් පිරිවෙනක් විසින් හෝ ඒ පිරිවෙන් දෙකම විසින් ඒ ඒ පිරිවෙන්වල අධ්‍යාපන ආයතන පිහිටුවා ඒ ඒ පිරිවෙනෙහි වූ ඒ අධ්‍යාපන ආයතන විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතන වශයෙන් පිළිගෙන ලියාපදිංචි කරන ලෙස පාලක සභාව වෙත ලිඛිතව ඉල්ලීමක් කළහොත්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, පාලක සභාව විසින්, ඒ ආයතන විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අනුබද්ධායතන වශයෙන් ලියාපදිංචි කර ඒවා දියුණු කිරීම පිණිස මුදලින් ආධාර දිය යුතුය :

එසේම තවදුරටත් මෙහි වූ උපලේඛනයෙහි සඳහන් යම් පිරිවෙනක් විසින්, ඒ පිරිවෙනෙහි යම් අධ්‍යාපන ආයතනයක් පිහිටුවා, ඒ අධ්‍යාපන

ආයතනය විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයක් වශයෙන් පිළිගෙන ලියාපදිංචි කරන ලෙස පාලක සභාව වෙත ලිඛිතව ඉල්ලීමක් කළහොත්, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, පාලක සභාව විසින්, ඒ ආයතනය විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයක් වශයෙන් ලියාපදිංචි කර එය දියුණු කිරීම පිණිස මුදලින් ආධාර දිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති" යන වචන හා ඉලක්කම් වෙනුවට "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති" යන වචන හා ඉලක්කම් වෙනුවට "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "පාලක සභාව විසින් නියෝග සාදනු ලැබිය හැකි ය" යන වචන වෙනුවට "ජනාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව පාලක සභාව විසින් නියෝග සාදනු ලැබිය හැකි ය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියෙහි "අනුබද්ධායතනය", "අධ්‍යාපන ආයතනය" සහ "උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙහි අර්ථකථන අත්හැර, ඒ වෙනුවට පහත සඳහන් අර්ථකථන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

' "අනුබද්ධායතනය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක පිහිටි යම් උසස් අධ්‍යාපන ආයතනයක් හෝ පිරිවෙනක් විසින් කළමනාකරණය කරනු ලබන්නා වූ ද මේ පනත යටතේ අනුබද්ධායතනයක් වශයෙන් පිළිගෙන ලියාපදිංචි කර ඇත්තා වූ ද යම් අධ්‍යාපන ආයතනයක් හෝ අදහස් වේ;

" අධ්‍යාපන ආයතනය " යන්නෙන්, විශ්වවිද්‍යාලයේ විභාග සඳහා අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යාම පිණිස විශ්වවිද්‍යාලයට පිළිගත හැකි අන්දමේ අවශ්‍ය පහසුකම් ඇති යම් ආයතනයක් අදහස් වේ ;

" උසස් අධ්‍යාපන ආයතනය " යන්නෙන්, විශ්වවිද්‍යාලයේ විභාග සඳහා අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යනු ලබන යම් ආයතනයක් අදහස් වේ.'.

6. ප්‍රධාන ප්‍රඥප්තිය අගට පහත දැක්වෙන උපලේඛනය එකතු කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියට උපලේඛනය එකතු කිරීම.

" උපලේඛනය (6 වන වගන්තිය)

1. පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙන,

2. බලගල්ලේ සරස්වතී පිරිවෙන.".